# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2398/42 - 2024 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2024.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 04 දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියෙහි 3(8) වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි 154ඇ ව්‍යවස්ථාව හා 1989 අංක 04 දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියෙහි 3(8) වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියෙහි සාමාජිකයෙකු හා සභාපති වශයෙන් කටයුතු කරනු ලබන උපාලි කොඩිකාර යන අය, එම ධූරයේ කටයුතු කිරීමේ දී අධිකාරියෙහි බලතල හා කාර්යය නිසියාකාරව ඉටු කිරීමට අපොහොසත් වී ඇති බවට සෑහීමකට පත්ව ඇති හෙයින් එකී උපාලි කොඩිකාර යන අය ඔහු දරන ලද බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියෙහි සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී,
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 23 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 08 - 0274

1A - PG 6840— 07 (2024/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*